# UNIVERSITY OF PERADENIYA
## පේරාදෙණිය විශ්වවිද්‍යාලය
## CENTER FOR DISTANCE & CONTINUING EDUCATION
## දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පරීක්ෂණය - 2014**
**(2015 - අගෝස්තු)**
කාලය පැය 03 යි

**ඉතිහාසය IV (HG 4)**
**ක්‍රි ව 1600 දක්වා ශ්‍රී ලංකාවේ ඉතිහාසය**

**එක්** කොටසකින් යටත් පිරිසෙයින් **එක** බැගින් තෝරා ගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
සුදුසු තැන්හි ඔබේ පිළිතුරු දළ සිතියම් මගින් පහදන්න.
නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපාහරිනු ලැබේ.
මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව දහය (10) කි.

### පළමු වැනි කොටස

1. ක්‍රිස්තු වර්ෂ හතර වැනි සියවස දක්වා ශ්‍රී ලංකාවේ සංස්කෘතික ඉතිහාසය හැදෑරීමෙහිලා **මහාවංසයට** හිමිවන ස්ථානය ප්‍රමාණ කරන්න.

2. "දුට්ඨගාමණී රාජ්‍ය සමයෙහිදී දිවයින මුල් වරට එක්සේසත් කරන ලදී." පහදන්න.

3. ක්‍රිස්තු වර්ෂ දහවැනි සියවස දක්වා ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතුවලදී විදේශ වෙළෙඳාමට හිමිව තිබූ ස්ථානය ප්‍රමාණ කරන්න.

4. තාක්ෂණික අංශය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කොට රජරට ශිෂ්ටාචාරයෙහි පැවති වාරි කර්මාන්තය පිළිබඳ විචාරාත්මක රචනයක් ලියන්න.

5. පහත සඳහන් මාතෘකා පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න.
   I. නාලන්දා ගෙඩිගේ
   II. ආර්ය චක්‍රවර්ති රජ පෙළපත
   III. චන්ද්‍රභානුගේ ආක්‍රමණය
   IV. පළමු වැනි විමලධර්මසූරිය

### දෙවැනි කොටස

6. ශ්‍රී ලංකාවේ චෝළ බල ව්‍යාප්තිය විස්තර කොට එහි ප්‍රතිඵල කවරේදැයි විස්තර කරන්න.

7. පොළොන්නරු යුගයේ පැවති කාලිංග-සිංහල සබඳතා පිළිබඳ විභාග කරන්න.

8. දෙවැනි පරාක්‍රමබාහු රජුගේ දේශපාලන කාර්ය සංසිද්ධිය සැකෙවින් සාකච්ඡා කරන්න.

9. ගම්පළ යුගයේ කලා හා ගෘහනිර්මාණ ශිල්පය පිළිබඳ විචාරාත්මක විග්‍රහයක් කරන්න.

10. පෘතුගීසින් සහ කෝට්ටේ රාජධානිය අතර පැවති සබඳතාව සමාලෝචනය කරන්න.